# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2398/12 - 2024 අගෝස්තු මස 20 වැනි අඟහරුවාදා - 2024.08.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාත් සභාව

### කොළඹ මහා නගර සභාව විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වාගෙන යන මළාපවහන සේවා සඳහා ගාස්තු නියම කිරීමේ දී අදාළ කරගත යුතු නිර්ණායක

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2310/22 හා 2022.12.14 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශිත, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමඟ කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥා පනතේ 326 වගන්තිය යටතේ වූ "කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයට අදාළව කොළඹ මහා නගර සභාව විසින් මළ ප්‍රවාහනය සේවාව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ගාස්තු නියම කිරීමට අදාළ නියමය" හි 4 වන වගන්තිය යටතේ මා වෙත නියම කර ඇති විධිවිධාන ප්‍රකාරව, කොළඹ මහා නගර සභාව විසින් මහා නගර සභා බල ප්‍රදේශය තුළ පවත්වා ගෙන යන මළාපවහන සේවා සඳහා ගාස්තු නියම කිරීමේ දී අදාළ කරගත යුතු බවට මවිසින් තීරණය කරන ලද නිර්ණායක මෙහි පහත උපලේඛනයට ඇතුළත් කර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන බව නිවේදනය කරමි.

එස්. කේ. ජයසුන්දර,
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

වර්ෂ 2024 ක් වූ අගෝස්තු මස 16 වැනි දින,
අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල,
පළාත් සභා ගොඩනැගිල්ලේ දී ය.

1A - PG 6831 — 09 (2024/08)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## උපලේඛනය

01. ඕනෑම පරිශ්‍රයක මාසික මළාපවහන ගාස්තුවට, පරිහරණ ගාස්තුව, මාසික සේවා ගාස්තුව, අනෙකුත් ගාස්තුන් හා අදාළ බදු ඇතුළත් විය යුතුය.

02. කොළඹ මහා නගර සභාව විසින් මහා නගර සභා බලප්‍රදේශය තුළ පවත්වාගෙන යන මළාපවහන සේවා සඳහා ගාස්තු නියම කිරීමේ දී සියලුම සේවාලාභීන් පහත පරිදි පාරිභෝගික ප්‍රභේදවලට වෙන් කළ යුතු අතර, එක් එක් පාරිභෝගික ප්‍රභේද සඳහා වෙන් වෙන්ව ගාස්තු අයක්‍රම තීරණය කළ යුතුය.

| සේවාලාභී කාණ්ඩය | ජල පාරිභෝගික ප්‍රභේද අංකය සහ ප්‍රභේදය | ගාස්තු අයක්‍රමය |
|---|---|---|
| ගෘහ සහ සහාධිපත්‍ය නිවාස | 10 - ගෘහ<br>11 - මණ්ඩල නිල නිවස<br>13 - රජයේ නිල නිවාස<br>14 - වතු නිවාස (සමෘද්ධිලාභීන් නොවන)<br>17 - නාගරික සංවර්ධන අධිකාරියට අයත් නැවත පදිංචි කිරීමේ සහාධිපත්‍ය නිවාස<br>18 - සහාධිපත්‍ය නිවාස ගෘහ<br>19 - තානාපති නිවාස<br>20 - ගෘහ නිවාස (සමෘද්ධිලාභීන්)<br>24- වතු නිවාස (සමෘද්ධිලාභීන්) | අයක්‍රම අංක 01 (ගෘහ අයක්‍රමය) |
| රජයේ ආයතන, වාණිජ ආයතන සහ කර්මාන්ත | 60 - රජයේ ආයතන<br>61 - ත්‍රිවිධ හමුදා පරිශ්‍ර<br>62 - පොලිස් දෙපාර්තමේන්තු පරිශ්‍ර<br>63 - රජයේ රෝහල් | අයක්‍රම අංක 02 (වාණිජ අය ක්‍රමය - ගාස්තු අයක්‍රම 01 හා 03 සඳහා අයත් නොවන සියලු ජල පාරිභෝගික ප්‍රභේද) |
| | 65 - රජයට අයත් ව්‍යවසාය ආයතන<br>70 - වාණිජ ආයතන<br>71 - සංචාරක හෝටල් සහ ආගන්තුක නිවාස<br>72 - නැව් ප්‍රවාහන සේවා<br>77 - මිශ්‍ර සංවර්ධන<br>79 - තානාපති කාර්යාල<br>80 - වෙනත් වාණිජ හා පෞද්ගලික ආයතන<br>82 - මණ්ඩල පරිශ්‍ර | |
| | 73 - සුළු හා මධ්‍ය පරිමාණ නොවන කර්මාන්ත<br>75 - සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත | |
| පාසැල්, ආගමික සහ පූජනීය ස්ථාන, රජයේ අනුමත පුණ්‍යායතන සහ වෙනත් ලාභ නොලබන ආයතන | 12 - රජයේ පාසල්<br>15 - රජයේ උපකෘත පාඨශාලා<br>81 - ආගමික හා පූජනීය ස්ථාන සහ රජයේ අනුමත පුණ්‍යායතන<br>85 - වෙනත් ලාභ නොලබන ආයතන | අයක්‍රම අංක 03 (පාසැල්, ආගමික සහ පූජනීය ස්ථාන, රජයේ අනුමත පුණ්‍යායතන සහ වෙනත් ලාභ නොලබන ආයතන) |

03. මළාපවහන සේවා ගාස්තුව, එක් එක් පරිශ්‍රයේ ජල පරිභෝජනය පදනම් කරගනිමින් තීරණය කළ යුතු අතර, ඒ සඳහා 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 84 වන වගන්තිය යටතේ ජල සම්පාදන විෂයභාර අමාත්‍යවරයා විසින් වරින් වර සංශෝධන සහිතව නිකුත් කරනු ලබන නිවේදනයේ ප්‍රකාශිත අය ක්‍රමයන්ම අදාළ කරගත යුතුය.

04. මළාපවහන සේවා සඳහා ගාස්තු අය කිරීමේදී අවශ්‍ය වන එක් එක් පරිශ්‍රයේ ජල පරිභෝජනය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් ලබාගත යුතුය.

05. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සැපයුමට අමතරව වෙනත් විකල්ප ජල ප්‍රභව කිහිපයක් භාවිතා කරන විට ඒ සඳහා පරිහරණ ගාස්තුව වශයෙන් කොළඹ මහා නගර සභාව විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් අය කළ යුතු අතර එකී ගාස්තුව ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අයකරනු ලබන පරිහරණ ගාස්තුව ඉක්ම නොයෙන පරිදි විය යුතුය.

06. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙහි ජල සැපයුම රහිතව මළාපවහන සේවාව පමණක් ලබාගෙන ඇත්නම්, කොළඹ මහා නගර සභාවේ නිලධාරීන් විසින් පාරිභෝගිකයාගේ ද සහභාගීත්වය සහිතව සිදු කරනු ලබන ක්ෂේත්‍ර පරීක්ෂණයකින් පසුව තීරණය කරන ඇස්තමේන්තු ජල පරිභෝජන අගයක් මත ඉහත අංක 03 හි සඳහන් අයකුම අනුව තීරණය කළ යුතුය.

07. යම් මාසයක ජල පරිභෝජනය ශූන්‍ය වුවද, මාසික මළාපවහන සේවා ගාස්තුව සියළු පරිශ්‍ර සඳහා අදාළ විය යුතුය.

08. යම් අවස්ථාවක දී, මළාපවහන සේවාව මෙහෙයුම් තත්වයෙන් ඉවත් කළහොත් එය නැවත ක්‍රියාත්මක කිරීම සඳහා, නැවත සම්බන්ධතා ගාස්තුවක් සහ ඒ සඳහා වැයවන පිරිවැය අනුව කොළඹ මහා නගර සභාව විසින් කාලානුරූපීව තීරණය කරනු ලබන අතිරේක ගාස්තුවක් අය කළ යුතු අතර, එකී ගාස්තු මෙම කාර්යය සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් අයකරගනු ලබන ගාස්තු ඉක්ම නොයෙන පරිදි විය යුතුය.

EOG 08 - 0238

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.